අපි වෙනුවෙන් අපේ කෙනෙක් හියුම් නගර සභාවට..

චන්ද්‍රා බමුණුසිංහ (දයාසෝම) නාමයෝජනා දෙයි

විප්‍රවාසී ශ්‍රී ලාංකික ජනතාව බොහෝ විට තමන් ජීවත් වන රටේ හුදකලා ජන කොට්ඨාශයක් ලෙස වෙන්ව ජීවත් වනු අපි නිරීක්ෂණය කර ඇත්තෙමු. තමන් ජීවත් වන රටේ ප්‍රධාන ප්‍රවාහයෙන් බැහැරව දිවි ගෙවමින් තම තමන්ගේ හුදකලා ලෝක වල ජීවත් වන මෙවන් ශ්‍රී ලාංකිකයන්ගෙන් සිය සමාජයට වන මෙහෙයක් නැත. සිය ජන කොට්ඨාශයට දිවි ගෙවන රටෙන් ලබාගත හැකි බොහෝ දේ මේ නිසා මග හැරී යයි.

ප්‍රධාන ප්‍රවාහයේ සමාජ දේශපාලනික ව්‍යුහයට අනුගත වී ඉදිරියට යාම අද දවසේ විප්‍රවාසී ශ්‍රී ලාංකිකයන්ගේ වගකීමක් බවට පත්ව තිබේ. මේ වගකීම හඳුණාගත් අපේ සහෘදයකු ඔස්ට්‍රේලියාවේ හියුම් සිටි කවුන්සිලයේ මන්ත්‍රීධුරයක් සඳහා තරග වැදීමට නාමයෝජනා බාර දී ඇත. ඔහු චන්ද්‍රා (දයාසෝම) බමුණුසිංහ මහතා යි. ඔහුගේ ගමනට ශක්තියක් ලබා දීම ශ්‍රී ලාංකික අප සැමගේ යුතුකමකි.

මේ චන්ද්‍රා බමුණුසිංහ මහතා සමග සන්නස කළ සාකච්ඡාවකි.

බබ මෙම මැතිවරණයට තරග කිරීමට තීරණය කළේ ඇයි?

අප මෙරට සමාජයේ සුලු ජාතියක් ලෙස ජීවත් වන විට හැමවිටම උත්සාහ කරන්න ඕනෙ ප්‍රධාන ජාතීන් හා එක්ව අත්වැල් බැඳගෙන ඉදිරියට යන්න. එවිට තමයි මේ සමාජයෙන් අපේ ජන කොටසට ලබා ගත හැකි දේ ලබා ගන්න ශක්තියක් අපට ලැබෙන්නෙ. අපිත් මේ ජන සමාජයේම ප්‍රධාන මෙහෙවරක් කළ හැකි කොටසක් බව පෙන්වා දෙන්න මේ වගේ අවස්ථා අපි ප්‍රයෝජනයට ගන්න ඕනෙ.

මේ මැතිවරණය පැවැත්වෙන්නේ මොන ආකාරයට ද?

නගර සභා මැතිවරණ වලදී අපේක්ෂකයන් පක්ෂ වශයෙන් ඉදිරිපත් වන්නේ නැහැ. නමුත් මේ හැම අපේක්ෂකයෙක්ම වගේ යම් යම් දේශපාලන පක්ෂ වලට සම්බන්ධව ඉන්න අය. ඒ ඒ පක්ෂ වලින් අනියම් ලෙස ඒ අයට සහය ලැබෙනවා. මම සම්බන්ධ වෙලා ඉන්නෙ ඔස්ට්‍රෙලියාවේ ලේබර් පක්ෂයටයි. සාමාන්‍ය මැතිවරණයකදී සුදුවන ආකාරයට වැඩි ඡන්ද ගන්නා අය නගරසභා මන්ත්‍රීවරුන් ලෙස තෝරා පත් කර ගන්නවා.

බබ මේ සඳහා යොමු වෙන්නෙ කෙනොමැද?

විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෙ මාව මේ සඳහා යොමු කළේ අපේ ප්‍රජාවේ ඉදිරියෙන්ම සිටින සමාජ සේවකයකු වන ගාමිණී පෙරේරා මහතා යි. ඒ මහතාට මගේ ස්තූතිය පුද කරන්නත් මම කැමතියි. ඔහුගේ මග පෙන්වීම මත තමයි මං ඕස්ට්‍රේලියාවේ ලේබර් පක්ෂයේ වැඩ කටයුතු වලට සම්බන්ධ වුණේ.

මේ මැතිවරණයට ඉදිරිපත්වීමේදී බබ බලාපොරොත්තු වන අර්ථමුණු මොනවාද?

මම දැන් කාලයක සිට අපේ ජන කොටස් - විශේෂයෙන්ම තරුණ කොටස - දේශපාලනය කෙරෙහි යොමු කරන්න උත්සාහයක යෙදී ඉන්නවා. දේශපාලනය ගත්තම ලොකේ කොතැනත් එකයි. ලංකාවෙත් එකයි. ඔස්ට්‍රේලියාවෙත් එකයි. ක්‍රියාත්මක වන ආකාරයේ පමණයි වෙනසක් තියෙන්නෙ. ප්‍රජාතන්ත්‍රවාදයේ තියන සියලු හොඳ අංග මේ රටේදි අපට දකින්න පුලුවන්. ඉතින් මෙවැනි තනතුරු ලබා ගැනීම තුළින් අපේ තියෙන ප්‍රශ්න වලට පිළිතුරු සොයා ගන්න අපට හැකියාව ලැබේ යයි මම විශ්වාස කරනවා.

මේක දිග ගමනක්. මේ දිග ගමනේ පළමු පියවර තමයි නගරසභා මැතිවරණය. එතැනින් ඉදිරියට යන්න බබ අදහස් කරනවාද?

මේ ගමන ඉදිරියටම යා යුතුයි. නමුත් මේ අවස්ථාවේ මගේ අවධානය ප්‍රධාන වශයෙන් යොමු වන්නේ මේ මැතිවරණය කෙරෙහියි. මෙයින් ලබන ජයග්‍රහණය තුළින් තමයි මගේ ඉදිරි සැළසුම් තීරණය වන්නෙ. මෙතෙනදිත් මම උත්සාහ කරන්නෙ අපේ අය වැඩි වැඩියෙන් මේ ප්‍රධාන ප්‍රවාහයේ දේශපාලනයට සම්බන්ධ කරමින් ඉදිරියට යාමයි.

නගර සභා මන්ත්‍රී වරයකුගේ කාර්ය භාරය මොන වගේ එකක්ද?

පාර්ලිමේන්තුවක කටයුතු කෙරෙන ආකාරයත් නගර සභාවක කටයුතු කෙරන ආකාරයත් වෙනස්. නගර සභාවක විරුද්ධ පක්ෂයක් නැහැ. සියලුම දෙනා එකතු වෙලා තමයි අවසාන තීගමන වලට එන්නෙ. නගර සභාවට වරිපනම් බදු ගෙවන සියල්ලන්ගේම සුබ සාධනය තමයි මෙතනදි කෙරන්නෙ. නගර සභාවට අයත් මාර්ග සේවා සොබ්‍ය සේවා වැඩිහිටි සුබ සාධනය ක්‍රීඩා කටයුතු පුස්තකාල ආදී සියලුම දේ මෙයට ඇතුලත් වෙනවා.

මේ ඡන්දය පැවැත්වෙන ආකාරය ගැන යමක් කිව්වොත්

හියුම් නගර සභාවේ තියෙනවා වෝඩ්ස් හතරක්. එයින් එයිරිකන් වෝඩ් එකට තමයි මම ඉදිරිපත් වෙන්නෙ. එයිරිකන් වෝඩ් එකට මන්ත්‍රීවරු තුන් දෙනෙක් තෝරා ගන්නවා. අනිත් වෝඩ් වලත් කවුන්සිලර්ස්ලා හය දෙනෙක් ඉන්නවා. එතකොට ඔක්කොම නව දෙනෙක් තෝරා ගන්නවා.

එයිරිකන් වෝඩ් එකට ග්‍රීන්වේල් රොක්ස්බර්ග්-පාක් ක්‍රෙගිබර්න් කැල්කැලෝ මික්ලැම් යුරෝක් යන ප්‍රදේශ සහ මෙඩෝහයිට්ස් ප්‍රදේශයෙන් කොටසකුත් මෙයට ඇතුළත් වෙනවා.

ඡන්දය පාවිච්චි කරන ආකාරය කොහොමද?

ඔස්ට්‍රේලියානු පුරවැසිභාවය තියෙන සහ ඡන්ද නාමලේඛණයේ ලියාපදිංචිව ඉන්න හැමට ඡන්දය තියෙනවා. නොවැම්බර් 28 වන විට අවුරුදු 18ට වැඩි හැමට ඡන්දය හිමිවෙනවා. නමුත් ඔවුන් ඡන්ද නාමලේඛණයේ ලියාපදිංචි විය යුතුයි.

ඒ හැරුණාම මේ ප්‍රදේශයේ වරිපනම් බදු ගෙවන අයටත් ඡන්දය හිමිවෙනවා. බදු ගෙවන එක් දේපළක් වෙනුවෙන් උපරිම වශයෙන් ඡන්ද දෙකක් හිමිවෙනවා. ඔවුන් මේ ප්‍රදේශයේ පදිංචිව නොසිටියත් ඔවුගේ දේපළ මේ ප්‍රදේශයේ තිබෙනවා නම් ඔවුන්ටත් ඡන්දය හිමියි.

ඡන්දය පැවැත්වෙන දිනය කවදා ද?

නොවැම්බර් 12 13 දිනවලදී ඡන්ද පත්‍රිකා තැපෑලෙන් ලැබෙනවා. නොවැම්බර් 28 වන දින සවස 6 ට පෙර ලැබෙන සේ ඡන්දය තැපැල් කළ

යුතුයි. මේක තැපැල් ඡන්දයක්. නොවැම්බර් 29 ඡන්දය පැවැත්වෙනවා.

කෙනෙකුට අවශ්‍ය නම් බබට ඡන්දය දෙන්න එය කරන්නෙ කොහොමද?

ඡන්ද පත්‍රිකාවේ මගේ නම - චන්ද්‍රා බමුණුසිංහ - ඉදිරියෙන් අංක 1 ලකුණු කළ යුතුයි. මම ඉල්ලා සිටින්නේ මගේ "වෝ ටු වෝට්" කාඩ් පතේ සඳහන් කරන ආකාරයට මනාප ලකුණු කරන්න කියලයි. මනාප සියල්ලම ලකුණු නොකලොත් ඒ ඡන්ද පත්‍රිකාව අවලංගු වන බවත් මතක තබාග න්න.

සමහර මාධ්‍ය හරහා ඔස්ට්‍රේලියාවේ දේශපාලනය හා ලංකාවේ දේශපාලනය එකබයි කියා මතයක් ප්‍රචාරය කරන්න උත්සාහ කරනවා. මේ ගැන බබේ අදහස මොකක්ද?

ඒ වගේ ප්‍රකාශවලින් පේන්නෙ මේ අයගේ තිබෙන නොදැණුවත් කම තමයි. දේශපාලනයේ නියැලුණ අයගේ යම් යම් දුර්වල කම් තිබෙන බව ඇත්තයි. නමුත් ඕනෑම කෙනෙක් දන්නවා ලංකාවේ දේශපාලකයන් සහ මේ රටේ දේශපාලකයන් අතර වෙනස. ලංකාවේ වගේ ප්‍රසිද්ධියේ වැරදි වැඩ කරන දේශපාලකයන් මේ වගේ රටවල නැහැර. මෙහෙ ඉන්න බොහෝ දේශපාලකයන් හෑඳ සාක්ෂියට එකගව වැඩ කරන අය. හොඳම උදාහරණය තමයි වික්ටෝරියාවේ හිටපු මහඇමති ස්ටිව් බ්‍රැක් මහතා. සිය පුතා වරදක් කළ ගමන් ඔහු සිය තනතුරෙන් ඉල්ලා අස්වුනා. ඒ වගේ දෙයක් කවදාවත් අපට ලංකාවෙදි දකින්න පුලුවන්ද?

මෙහේ දේශපාලකයන් ලංකාවේ දේශපාලකයන් හා සම කරලා කතා කරන මේ මාධ්‍යවල ඉන්න අයට තමන් කතා කරන දේ පිළිබඳව කිසිම දැනීමක් නැති බව ඔවුන් ප්‍රදර්ශණය කරනවා.

බබේ අනෙකුත් සමාජ සේවා කටයුතු ගැන කතා කළොත්

මේ දවස් වල අපි උතුරු වික්ටෝරියා සුබ සාධක සංගමයේ වැඩ කටයුතු වල නියැලී ඉන්නවා. ඒ එක්කම තවත් සංගම් රැසකට සම්බන්ධව ඉන්නවා. එයට අමතරව සමාදාන විනිශ්චයකාරවරයකු ලෙසත් සමාජ සේවයක නියැලී ඉන්නවා. ඒ එක්කම ඉන්ඩිපෙන්ඩන්ට් තර්ඩ් පර්සන් - ඒ කියන්නෙ ස්වාධීන තුන්වන පරිශ්වයක් - ලෙස කටයුතු කරනවා. පොලිසිය වැනි නීතිය ක්‍රියාත්මක කර තැන් වලදී සමාජයේ යම් යම් අය වෙනුවෙන් පෙනී සිටීම තමයි මෙහදි කෙරෙන්නෙ. විශේෂයෙන්ම ආබාධිත පුද්ගලයන් වෙනුවෙන් පෙනී සිටීම. එයට අමතරව 3zzz ගුවන්විදුලියේත් මම කටයුතු කරනවා.

බබ බොහෝ සමාජ කටයුතු වලදී අපට දැකගන්න පුලුවන්. මෙවැනි කටයුතු සඳහා කාලය සොයාගන්නෙ කොහොමද?

සැළසුම් සහගත ලෙස කටයුතු කිරීම තමයි රහස. ඒ එක්කම මේ වැඩ සඳහා මගේ මිත්‍රයන්ගේ නෑදෑ හිතවතුන්ගේ සහ මගේ බිරිඳ දරුවන් ඇතුළු පවුලේ සහයෝගය මට ලැබෙනවා. ඔවුන් මට ශක්තියක්.

අවසාන වශයෙන් යමක් කිව්වොත්

මම ඉල්ලා සිටිනවා මේ මැතිවරනයේදී මා වෙනුවෙන් ඡන්දය පාවිච්චි කර අපේ හඬ ඉදිරියට ගෙනයන්න සහයෝගය දෙන්නයි කියලා. මම දන්නවා ඔබ සැමගේ සහය මට ලැබෙන බව. මේ ගමන යන්නට මට ශක්තිය සපයන සියලු දෙනාටම සහ සමස්ත ශ්‍රී ලාංකික ප්‍රජාවට මගේ ස්තූතිය පුද කරන්න කැමතියි.

සාකච්ඡා කළේ

ශ්‍රීනාත් මද්දුමගේ

---

1 වන පිටුවෙන් (සාගරයක් මැද)

කැළඹුණි. මේ අතර පළාත් සභා ඡන්ද විමසීම නිසා ටික දිනක් යටපත් වී තිබූ එ.ජා.ප.යේ අභ්‍යන්තර ගැටුම් ද යළි ආරම්භ වී තිබේ. සංශෝධන ගෙන එන අය කියා සිටින්නේ, එ.ජා.ප.යේ දැනට සිටින නායකයා නායකත්වය දරන තුරු ඡන්දයකින් දිනන්නට නොහැකි බවය. මැතිවරණ සටන ආරම්භ වීමෙන් පසු, එය ජයගන්නට තමන් හරිහමන් කැපවීමක් නොකිරීම ඇතුළු බැරෑරුම් සමාජ-දේශපාලන කරුණු තිබියදීත් පරාජයට හේතුව වශයෙන් ඔවුන් වෙහෙස වී සොයාගෙන ඇති කරුණ එයය. ඒ නිසා ඊළඟ ඡන්දයවත් දිනන්නටනම් අළුත් නායකයකු පත් කරගත යුතු බව ඔවුන්ගේ නිගමනයය. හොඳයි, එහෙම අළුත් නායකයකු පත්කරගෙන ඊට පස්සෙත් ඊළඟ මැතිවරණයත් පරාජය වුවහොත්?.....එහි වගකීම දරන්නේ කවුද? සංශෝධන ගෙන එන්නන් මොන තරම් අවංක වුවත් ඒවා යථාර්ථවාදී නොවේ නම් ඉන් පලක් නැත. ඒ කොයි හැටි වෙතත් එ.ජා.ප.යේ නායකත්වය ගැන මෙම මතය මුලින්ම දැරුවේ ශ්‍රී.ල.නි.ප.ය යි. එනිසා මෙම මතය එ.ජා.ප.ය තුළින් උපන් මතයක් යැයි කියනවාට වඩා එ.ජා.ප.යට පිටින් ඊට විරුද්ධ කඳවුරෙන් උපන් මතයක් යැයි හැඳින්වීම වඩාත් නිවැරදිය. එසේ කියන්නට සිදුවන්නේ 1994 දී බලයට පත් වූ චන්ද්‍රිකා කුමාරතුංග ආණ්ඩුව, එකල මැතිවරණ ගණනාවක් ජයගෙන, ඉන් පසු මෙම මතය මුලින් ම පලකළ බැවිනි. සූක්ෂම ලෙස ජනමතය යටපත් කැරුණු, අතුමිකතාවන්ගෙන් හා දූෂණයෙන් පිරි, එම ජන්ද විමසීම්, සාධාරණ ජන්ද විමසීම් ලෙස නුවා දැක්වීමට, නම් එ.ජා.ප.නායකත්වය ගැන එවැනි මතයක් නිර්මාණය කිරීමේ සාමූහික වගකීමක් ඒ ඇමැති මණ්ඩලයට තිබිණ. ඉතින් එම මතය පිලිගැනීම එ.ජා.ප.යේ මෝඩකමක් මිස ශ්‍රී.ල.නි.ප. යේ වරදක් නොවේ. එළුවෙකු කර තබාගෙන ගම් දනව් පසු කරමින් ගිය බමුනෙකුගෙන්, ප්‍රයෝජයක් මගින් ඒ එළුවා පැහැරගැනීමට සිත් වූ සොර මුලක්, කලින් කතිකා කරගත් පරිදි, බමුනා යන මඟ තැනින් තැන රැඳී සිට, බමුනාගේ කර මත සිටින එළුවා, එළුවෙකු නොව බල්ලෙකැයැයි කියා, බමුනා මුලාවේ හෙළා, ඒ එළුවා කරින් බැහැර කරවා, පැහැරගත් සැටි පංචතන්ත්‍රයෙහි එන කතාවකින් කියැවේ. අනුන් බස් අසා, තමන් ගැන නො විමසා, අතාර්කික කරුණු මත පිහිටා, ක්‍රියා කිරීමෙන් උපන් එ.ජා.ප.යේ අර්බුදය ද ඒ බමුනා ගැන කතා වස්තුවට වඩා බරපතල වෙනසක් ගන්නේ නැත.

එ.ජා.ප.ය වූ කලී, රටේ අනෙකුත් පක්ෂ මෙන් බැරෑරුම් න්‍යායන් කරට ගත් පක්ෂයක් නොවේ. එය සාමාන්‍ය ජෘතන්ජන මිනිසුන් ගෙන් සංයුක්ත වූ, සමස්ථ සමාජයේම ඇති සියළු සමාජ මූල ද්‍රව්‍යයන් අඩංගු පක්ෂයකි. ඒ නිසාම සංඛ්‍යාවෙන් විශාල සංවිධානයක් වශයෙන් පවතින එය, සරල ප්‍රායෝගික දැක්මක් ඇති වෙන්දීය දේශපාලන පක්ෂයකි. එබැවින් සංකීර්ණ සමාජ අර්බුද වටහාගැනීමට එයට කල් ගත වන අතර, ඒවාට විසැඳුම් සෙවීමට ඊටත් වඩා කල් ගත වේ. පුද්ගලික ව්‍යවසාය කෙරෙහි මුල් තැන දී ක්‍රියා කරන සංවර්ධන මූලෝපායක් හැරුණුවිට වෙනත් බැරෑරුම් සමාජ න්‍යායක් ඊට ඇත්තේ නැත. මේ නිසාම විවිධ න්‍යායන්ගෙන් සංකර වූ රටේ අනෙකුත් දේශපාලන ධාරාවන් සමග න්‍යායික පොරබැදීම ඊට පහසු නැත. රාජ්‍ය බලය පැහැරගැනීමට අනෙකුත් පක්ෂ යොදන විවිධ උප්පරවැට්ටි හෙළි දරව් කොට, ඒවා බණ්ඩනය කරනවා වෙනුවට, ඒවා ගෙඩිපිටින් තමන් ද අනුගමනය කළයුතු යැයි කියා එ.ජා.ප.ය තුළ මතු කැරෙන අදහස් වලට අවකාශය ලැබී ඇත්තේ ඒ අනුවය. එවැනි අනුකරණයන් තාවකාලික දේශපාලන මිහිරක් ගෙන ආවත්, දිගුකාලීන වශයෙන් සිදුවන්නේ ජන සමාජය දූෂණය වී, සැම දෙනාම ජීවත් වන ක්‍රමය බලවත් ලෙස රෝගාතුරවීම බව ඒ යෝජනා ඉදිරිපත් කරන අයට වැටහී නැත. ඔවුන් අනුයන්නේ, උපාය මාර්ගය කුමක් වුවත් (දුෂිත වුවත්) අවසන් ප්‍රතිපලය විසින් ඒ උපාය සාධාරණය කෙරෙනු ඇත, යන මකියාවෙල්ලිගේ ඉගැන්වීම බව පැහැදිලිය. මකියාවෙල්ලි පඩිවරයාගේ කියුම් කෙරුම් වැඩවසම් පාලන යුගවලට හරිගියත් ඒ උපාමාරු අප අද ජීවත්වන ශිෂ්ට සම්පන්න ප්‍රජාතන්ත්‍රවාදී යුගයට ඒ හැටියෙන්ම හරියන්නේ නැත. බලය ලබා ගැනීමට ඒ ලාබ දේශපාලන

36 වන පිටුවට